පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඇස්මේන්තු පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

நிறுவனத்தின் பெயர் : மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 492

Name of the institution: Ministry of Women and Child Affairs

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - **492**

ආයතනයේ නම - **කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය**

වාර්තාවෙන් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
<u>පළමු කොටස</u> 01.හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2021 වර්ෂයේ සිට 2026 දක්වා හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර ඇත.
02.විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2023 වර්ෂයේ ඉදිරිපත් කර ඇති ඇතැම් විගණකාධිපති විගණන විමසුම සඳහා පිළිතුරු සැපයීම මසකට වඩා වැඩි කාලයක් ගත වී තිබූ නමුත්, 2024.01.17 දින වන විට 2023 වසරේ ඉදිරිපත් කළ සියලුම විගණකාධිපති විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත. වර්තමානය වන විට මෙම තත්වය වලක්වා ගැනීමට සියලුම අංශ දැනුවත් කර ඇත.
03.අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2023 වර්ෂයේ සියලු අභ්‍යන්තර විගණන විමසුම සඳහා පිළිතුරු සපයා ඇත. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයන ලෙස සියලුම අංශ දැනුවත් කර ඇත.
04.වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2025.12.31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලින් විශාල ප්‍රමාණයක් මේ වන විට නිම කර ඇති අතර, අවසන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ඇතුළු පසු කටයුතු 2026.06.30 දිනට නිම කරන ලෙස සියලු අංශ වෙත දන්වා ඇත.
05.සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි ලේඛන ලබා ගෙන ඇත.
06.සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	අමාත්‍යාංශය සතු වාහන සංඛ්‍යාව 29කි. එයින් වාහන 27ක රාජ්‍ය ලාංඡනය පින්තාරු කරන ලදී.

<table>
<tr><td>07.වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.</td><td>මෙම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම සඳහා පහත පරිදි වෙනත් රජයේ ආයතන වෙත පවරා දෙන ලදී.

2023 වර්ෂයේ WP KH 9256, WP KH 6643, WP KH 2854 අංක දරන මෝටර් කාර් රථ යුධ හමුදාවට පවරා දෙන ලදී. 64-3160 අංක දරන ජීප් රථය මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලදී.

2024 වර්ෂයේ KM 7727 අංක දරන ජීප් රථය යුධ හමුදාවට පවරා දෙන ලදී.

2025 වර්ෂයේ KB 0377 හා KH 1737 අංක දරන මෝටර් කාර් රථ 02 ශ්‍රී ලංකා පොලීසියට පවරා දෙන ලදී. 2025 වර්ෂයේ WP GV 6082 හා 207-1449 අංක දරන ත්‍රීරෝද රථ අපහරණය කරන ලදී.</td></tr>
<tr><td>08.මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.</td><td>මු.රෙ. 94(2) ප්‍රකාරව ඉඩ දී ඇති සීමාවන් තුල බැඳීම්වලට එළඹීම සිදු කර ඇත.</td></tr>
<tr><td>09.නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.</td><td>2021.08.02 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ ලිපි අංක DMA/AMC/SM/2020/01 ප්‍රකාරව දෙවන කාර්තුව අවසන් වීමට ප්‍රථම බැඳීම් සඳහා එළඹීමට ලිපි ගිණුම් අංශය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ අංශ දැනුවත් කර ඇත.</td></tr>
<tr><td>10.වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.</td><td>2023 වර්ෂයේ පැවති වර්ෂයට වඩා වැඩි ණය ශේෂ පහත පරිදි නිරවුල් කර ඇත.

<table>
<tr><td>නිලධාරියාගේ නම</td><td>මුදල</td><td>නිරවුල් කල දිනය</td></tr>
<tr><td>පී.පී.ටී. අප්සරා</td><td>රු. 3,750.00</td><td>2026.01.02</td></tr>
<tr><td>පී.එල්.බී.සී. ලියනගේ</td><td>රු.85,394.00</td><td>2024.12.27</td></tr>
<tr><td>බී.ඒ.පී.ඩී.පී. සමරවීර</td><td>රු.117,832.00</td><td>2024.06.28</td></tr>
</table>
</td></tr>
<tr><td>11.මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.</td><td>මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මසක් ඇතුලත නිරවුල් කිරීම සිදු කරන ලෙස සියලුම අංශ දැනුවත් කර ඇති අතර, 2025 වර්ෂය වන විට මසක් ඉක්ම වූ නිරවුල් නොකළ තත්කාර්ය අතුරු අග්‍රිම නොතිබිණි.</td></tr>
</table>

<u>දෙවන කොටස</u> 01.සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතිණි.	<u>**2023 වර්ෂය**</u> 1. 2023 වර්ෂයේ අයවැය වක්‍රලේඛ අංක 01/2023 අනුව පුහුණු අවස්ථා සීමා කිරීමට සිදු වීම හේතුවෙන් පුහුණු කිරීම අවම කර ඇත. <u>**2025 වර්ෂය**</u> I. 2025 වර්ෂයේ දී වාර්ෂික පුහුණු සැලැස්ම අනුව සැලසුම් කළ පරිදි පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කර ඇත. 2025 වර්ෂයට අදාල දේශීය පුහුණු සැලැස්මෙහි ඇතුළත් පුහුණු සංඛ්‍යාව -18, 2025 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද දේශීය පුහුණු සංඛ්‍යාව - 15 II. දෙසැම්බර් මාසයට අදාලව ක්‍රියාත්මක කිරීමට තිබූ පුහුණු වැඩසටහන් දිවිවා ආපදා තත්වය හේතුවෙන් කල් දැමීමට සිදු විය. III. නිලධාරීන්ගේ අවශ්‍යතාවය මත වරින් වර පුහුණු සැලැස්ම සංශෝධනය වී ඇති අතර, ඒ අනුව සමස්ථයක් වශයෙන් 83%ක පුහුණු අවස්ථා ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ඇත. <u>**2026 වර්ෂය**</u> I. 2026 වර්ෂයට අදාලව මේවන විට සැලසුම් කර ඇති පරිදි කටයුතු කරමින් පවතී. II. මේ වන විට පුහුණු වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කර ඇත.
02.සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂය සඳහා වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු නිලධාරීන් සියලු දෙනා වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. 2026 වර්ෂයට අදාළව වත්කම් සහ බැරකම් ප්‍රකාශ 2026.06.30 දිනට පෙර මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියට තොරතුරු ඇතුළත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.

.....

සරෝජා සාවිත්‍රි පෝල්රාජ්
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය

සරෝජා සාවිත්‍රි පෝල්රාජ්
ගරු කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
06 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.